යම් කිසි සමාජ ගැටළුවක් අනවශ්‍ය භාවාතිශය ආකාරයකින්, උද්වේගය ජනිත කරන ආකාරයකින් වාර්තා කිරීම අද දිනයේ ජනමාධ්‍ය අතර දක්නට ලැබෙන අතර, මෙම උද්වේගය ජනිත කරවන ජනමාධ්‍යකරණය හොඳද නරකද යන කරුණ සම්බන්ධයෙන්ද වාද විවාදයන් දක්නට ලැබේ. එවැනි සිරස්තල යෙදීමකට උදාහරණයක් ලෙස අරුණ පුවත්පතේ "මිතුරන්ට සැප ගන්න පෙම්වතිය දන් දුන් නරුම පෙම්වතෙක්" යන මැයෙන් පළ වූ ලිපිය පෙන්වා දිය හැක.

මෙසේ භාවාතිශය ලෙසින්, පහත් රසයක් ලබාදෙන ලෙසින් සිදුවන මාධ්‍යකරණයකදී, සමබර හා අපක්ෂපාතී තොරතුරු ඉදිරිපත් කිරීමේ භාවිතාවක් පවත්වා ගැනීමට ඉඩ ලැබේ යැයි ඔබ සිතන්නේද? භාවාතිශය, පහත් රසයක් දෙන සිරස්තලය සමගින් එම සමාජ ගැටළුවක සැබෑ සිදුවීම, ඒ පසුපස තිබිය හැකි සියුම් තොරතුරු පාඨකයාට ග්‍රහණය නොවී, අවර ගණයේ කතාන්තරයක් පමණක් ඉතිරි නොවනු ඇති යැයි ඔබ සිතන්නේද? එපමණක් නොව, මෙම සිරස්තලයෙන් ජනිත වන අවර ගනයේ පහත් රසය නිසා අදාළ වින්දිතයාවද නැවත වතාවක් ලිපිය තුළ අපහරණයට ලක් නොවේ යැයි ඔබ සිතන්නේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

#MediaEthics #lka #SinhalaPress #Aruna